# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2092/59 - 2018 ඔක්තෝබර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : 3/3/8/7

*කුරුණෑගල දිසාපති අංකය* - 10/11/ඉප්‍ර/නික/6

**1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 2(1) වගන්තිය යටතේ නියමය**

1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 2(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව පූර්වගාමී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ලයනල් ගාමිණී දිසානායක මහතා විසින් ඉහත කී පනත හා එම වගන්තිය යටතේ ප්‍රකාශිත අංක 180/5 සහ 1982.02.17 දිනැති *ගැසට් නිවේදනයේ* ප්‍රකාශිත දිනය වන විට පහත උපලේඛනගත ඉඩම් කොටස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන නීතිමය බැඳීමක් නිදහස් කිරීමක් වශයෙන් කො/1362 ලිපිගොනුවේ ප්‍රකාශකගේ දරුවන් දෙදෙනෙකු වන අර්ජුන් ඉන්ද්‍රජිත් ගුණරත්න සහ අමිත ලාල් ගුණරත්න යන තැනැත්තන් වෙත ලබාදීමට තීරණය කර තිබීමත්, එම ඉඩම් වල බුක්තිය ඔවුන් වෙත භාරදී තිබීමත් හේතුවෙන් ඉහතකී *ගැසට් නිවේදනය* මගින් පරිපාලනමය දෝෂයක් සිදුවී ඇති බව නිරීක්ෂණය වන හෙයින්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම අර්ථ නිරූපණ ආඥා පනතේ 18 වන වගන්තියේ බලතල මත මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩමට අදළ එම නියමය මෙමගින් පිරිසුන් කොට ප්‍රකාශයට පත් කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 28 වැනි දින.

උපලේඛනය

ඉඩමේ විශාලත්වය : හෙක්ටයාර් 28.769
මිනුම්පති සකස්කළ මිනුම් පිඹුරේ අංකය : අවසාන ගම් පිඹුර 1543
කැබලි අංකය : 79
ඉඩමේ විස්තරය : (අ) පිහිටීම
දිස්ත්‍රික්කය : කුරුණෑගල
ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසය : කොබෙයිගනේ
ග්‍රාම සේවක කොට්ඨාසය : අංක 346, මාවුල්ල පළාත
ගම : උජේ කැලේ
ඉඩමේ නම : රොසලින්ඩ් වත්ත නොහොත් ගල්වැටිය වත්ත
මායිම් : උතුරට ලොට් 3, නැගෙනහිරට ලොට් 77 සහ ගම්සභා පාර
දකුණට ලොට් 67 සහ ලොට් 77 සහ ලොට් 7, බටහිරට : ගීකියන ගෙදර ගම් මායිම් සහ ලොට් 3 සහ 4

10-1406